SJSD 2022 2(2): 43 -58

**SRI LANKA JOURNAL OF SOCIAL DEVELEPOPEMENT** (SJSD)
**Volume 02 – Issue 02**

DOI: https://doi.org/10.4038/sljsd.v2i2.28

**ළමා අපයෝජනය හා එය අවම කිරීමෙහි ලා සමාජ වැඩකරුගේ මැදිහත්වීම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්**

# Sociological Inquiry into Child Abuse and the Social Worker's Intervention in Its Mitigation

**Upekshika G.LM.1.**[1],

[1] Assistant Lecturer, Department of Sociology, Univsity of Sri Jayawardhanapura

## Abstract

In today's complex society, social issues are emerging rapidly, significantly impacting the social fabric. One such critical and fast-escalating social problem is child abuse. A child is simply defined as any individual under the age of 18. Child abuse refers to any act by another individual—whether an adult or another child—that causes significant harm to a child.

This research, titled *"Child Abuse and the Social Worker's Intervention in Its Mitigation,"* explores how social workers in Sri Lanka can actively contribute to reducing child abuse. The primary objective is to study the possible roles and interventions social workers can undertake to mitigate child abuse. This study utilizes secondary data, focusing on reports of child abuse in Sri Lanka over the past five years—namely 2017, 2018, 2019, 2020, and 2021.

The discussion is grounded on how social workers can intervene in both the prevention and reduction of child abuse, primarily using data obtained from the National Child Protection Authority (NCPA) of Sri Lanka. Both qualitative and quantitative analyses are conducted using sociological research methods and SPSS software. The study ultimately highlights the effectiveness of institutional child protection systems in Sri Lanka and the potential of social worker interventions in preventing child abuse.

**Keywords:** Child, Child Abuse, Child Protection, Social Work, Social Worker

**හැඳින්වීම**


සමාජ ප්‍රශ්න රැසක් සීඝ්‍රව වර්ධනය වෙමින් පවතින යුගයක අනාගත ලොවෙහි කිරුළු දරන්නට සිටින ළමා පරපුර කෙරෙහි ප්‍රහල බලපෑමක් එල්ල කරන්නා වූ සමාජ ප්‍රශ්නයක් ලෙස ළමා අපයෝජනය හඳුන්වා දිය හැකිය. සමාජය තුළින් උපත ලබා සමස්ත සමාජයටම අහිතකර බලපෑම් කරන්නා වූ ද, වැඩි දෙනෙක් තුළ නිරතුරු අවබෝධයක් ඇත්තා වූ ද එකී අහිතකර සමාජ වාතාවරණය වෙනස්කිරීමේ ඕනෑකමක් ඇත්තා වූ ද, ගතික සිදුවීම් මාලාවක් සමාජ ප්‍රශ්නයක් ලෙස හැඳින්වේ(අමරසේකර, 1996, පි. 107). එවැනි සමාජ ප්‍රශ්නයක් ලෙස ළමා අපයෝජනය කැපී පෙනෙයි. බහුතරයක් සමාජ ප්‍රශ්න ළමා අපයෝජනය යන සමාජ ප්‍රශ්නය සමඟ සම්බන්ධව පැවතීම එයට හේතුවයි.

ළමයාට එරෙහිව සිදුවන අපචාර වත්මන් ලෝකය පුරාම සමාජ සංවර්ධනයේදී ප්‍රබල ගැටලුවක් වී ඇති බව පෙනී යයි. විශේෂයෙන් ම නූතනයේ ළමා අපයෝජනය හා බැඳී ඇති කලාප වන්නේ නැගෙනහිර ආසියාව හා දකුණු ආසියාවයි. නැගෙනහිර ආසියාවේ තායිලන්තය, පිලිපීනය, ඉංදුනීසියාව ද, දකුණු ආසියාවේ ලංකාව හා ඉන්දියාව ප්‍රධානය(අමරසේකර, 2005, පි. 25).ළමයා යනු කවුරුන්දැයි නිර්වචනය කරගැනීමේ දී, 1989 නොවැම්බර් මස 20 වන දින දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් අනුමත කරගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අනුව ඉතාමත් සරලම අදහස නම් "නීතිය මඟින් අඩු වයසක දී පූර්ණත්වය ලබන්නේ නම් මිස වයස අවුරුදු 18ට අඩු සියලු මනුෂ්‍යයන් ළමුන්ය" යනුවෙනි.

ළමයා යනු ආරක්ෂා කළ යුතු වැඩිහිටි ආධාර උපකාර ලබාගත යුතු බාලවයස්කාරයෙකු බව සාමාන්‍ය පිළිගැනීමයි. ළමයාගේ මානසික අවශ්‍යතා, පෞර්ෂ වර්ධනය, සමාජානුයෝජනය මානසික ස්වභාවය ආදී සංකල්ප පිළිබඳ අවධානය යොමු කළ යුතු බව පියාජේගේ ෆොයිඩ් මාරියා මොන්ටිසෝරි, ජෝර්ජ් වුඩ් ආදී මනෝවිද්‍යාඥයින් විග්‍රහකොට ඇත(මෙන්ඩිස්, 2015, පි 40).ළමා අපයෝජනය යනු ළමයෙකුට සැලකිය යුතු හානියක් සිදු කරන වෙනත් පුද්ගලයෙකු, වැඩිහිටියෙකු හෝ දරුවෙකු විසින් කරන ඕනෑම ක්‍රියාවකි. එය ශාරීරික, ලිංගික හෝ චිත්තවේගීය විය හැකිය, නමුත් බොහෝ විට ආදරය, සැලකිල්ල සහ සැලකිල්ල නොමැතිකම ගැන විය හැකිය. (NSPCC" 2018)

ළමයාගේ අයහපතට හේතු විය හැකි යමක් කිරීම හෝ ළමයාගේ යහපතට හේතුවිය හැකි දෙයක් නොකර සිටීම ළමා අපයෝජනයයි(පෙරේරා, 2011, පි. 70). උක්ත නිර්වචනය අනුව ළමයෙක් අපයෝජනයට ලක්වීම යම් ක්‍රියාවක නිරතවීමෙන් මෙන් ම නොවීමෙන් ද සිදුවෙයි. ළමා අපයෝජනය සිදු වන්නේ චේතනාත්මකව කරන ක්‍රියා මඟින් වුවත්, නොදැනුවත්ව සිදුකරන ක්‍රියා මගින් ද අපයෝජනය සිදුවෙයි. එසේ ම ළමයාට අනර්ථයක් සිදුවන ආකාරයෙන් සැලකීම හෝ ක්‍රියා කිරීම ළමා අපයෝජනය ලෙස ඔක්ස්ෆර්ඩ් ශබ්ධකෝෂය සඳහන් කරයි. දෙමාපියන් හෝ වෙනත් රැකබලාගන්නන් විසින් කරනු ලබන සෑම ආකාරයේ ක්‍රියාවක් හෝ නෙකර හැරීමක් මේ සඳහා අදාළවන අතර ළමා නිවාසයකදී වෙනත් ආයතනයක දී ජාලයකදී හෝ ළමයින් ගැවසෙන ප්‍රජාවක දී ළමා අපයෝජනය සිදුවිය හැකිය(කරුණාරත්න, 2020, පි 08)ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව විසින් 1995 දී ප්‍රකාශයට පත් කරන ලද

ළමා අපයෝජනය පිළිබඳ අත්පොත මඟින් පෙන්වා දී ඇති පරිදි අපයෝජන වර්ගීකරණය මෙසේය.




(ළමා අපයෝජනය පිළිබඳ අත්පොත, 1995, පි 07)

අපයෝජනයන් සිදුවිය හැකි ආකාරය අනුව එය වර්ගීකරණය කිරීමේ හැකියාවක් පවතී. මූලිකවම ළමා අපයෝජනය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී එය ප්‍රධාන කොටස් හතරකි.

**ශාරීරික අපයෝජනය** - ශාරීරික අපයෝජනයක් යනු යම් පුද්ගලයෙකු විසින් හිතාමතාම දරුවෙකු සඳහා ශාරීරිකව සිදු කරනු ලබන හිංසනයන්වේ.

**චිත්තවේගීය අපයෝජනය** - චිත්තවේගී අපයෝජනයේ දී ළමුන් වාචිකව හිංසනයට ලක්වීමක් සිදුවන අතර මෙය හිතාමතා හෝ අනියම් ආකාරයකින් සිදු වීමට ඉඩ තිබේ. මෙහි දී ළමයා වැදගත්කමක් නොමැති කෙනෙකු වශයෙන් ඒත්තු ගැන්වීමට ඉඩහැරීම ආදය චිත්තවේගීය අපයෝජනය වන අතර එය ශාරීරික අපයෝජනය වන තරමට ම හිංසාකාරීවේ.

**ලිංගික අපයෝජනය** - ලිංගික ක්‍රියාකාරකම් සඳහා පෙළඹවීමට ක්‍රියා කිරීම, ලිංගික හිංසනයන්ට යටත් කිරීම අදාළවන අතර ස්පර්ශයක් සහිත ලිංගික අපයෝජනය හා ස්පර්ශයක් රහිත ලිංගික අපයෝජනය යනුවෙන් ලිංගික අපයෝජනය දෙයාකාරයකි.

**නොසලකාහැරීම** - තම දරුවන්ට දෙමාපියන් විසින් ඉටු කළ යුතු වගකීම් නිසි ආකාරව ඉටු කිරීම පැහැර හැරීම මීට අදාළ වේ. (Jacobi, Dettmeyer, Silbylle, Brosing & Heramann, 2010, p 231).

ලොව පුරා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරිම උදෙසා විවිධ පනත්, ප්‍රඥප්ති ඉදිරිපත් වී ඇති අතර

- ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනය - 1924
- මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය -1948
- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය - 1989
- සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය

යනාදී දෑ නෛතිකවම ක්‍රියාත්මක වන අතර UNESCO, UNICEF, UNO යනාදී සංවිධානයන් ද මේ සඳහා ක්‍රියාත්මක වී සිටින බව හඳුනා ගත හැකිය. මීට අමතරව ශ්‍රී ලංකාවේ ද අණ පනත් රාශියක් ක්‍රියාත්මක වෙයි. ඒ අතර 1998 අංක 28 දරණ අධිකරණ සංශෝධන පනත, 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය පනත, 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත යනාදිය ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශේෂ වෙයි(ජයකොඩි, 2015, පි. 03).

මෙම ආයතනයන් ළමා අපයෝජනය සම්බන්ධයෙන් පිටත සිට ක්‍රියාත්මක වන ආයතන වන අතර වත්මන් සමාජ අවශ්‍යතාවය වී ඇත්තේ ළමා අපයෝජනයේ වින්දිතයා මෙන් ම අපයෝජකයා සමඟ ද සමීපව කටයුතු කරමින් වින්දිතයාට පහසුවෙන් ජීවත්වීමට හා අපරාධකාරී චර්යාවන් සමීපව හඳුනාගනිමින් ළමා අපයෝජන අවම කළ යුත්තේ කුමන අකාරයකින් ද යන්න හඳුනාගැනීමයි. මේ සඳහා වර්තමානයේ වැඩ ලෝකය තුළ ඉතා වේගයෙන් ජනප්‍රිය වෙමින් පවතින හා ප්‍රායෝගිකව භාවිතයට ගැනෙන සමාජ වැඩ වෘත්තිය හා සමාජ සේවකයා යන්න අවශ්‍යතාවයට ගැළපෙන ආකාරයේ උපයෝගීතාවයක් ලෙස පෙන්වා දිය හැකිය.

සමාජ වැඩ යනු පුලුල් අර්ථයකින් යුත් වෘත්තියක් වන අතර එය අවශ්‍යතා ඇති පුද්ගලයින්ට සේවය කරන වෘත්තියකි. "සමාජ වැඩ යනු සාරධර්ම න්‍යාය සහ භාවිතයේ අන්තර් සම්බන්ධිත පද්ධතියකි"

- සමාජකම්කරු සම්මේලනය -

"සමාජ වැඩ යනු පුද්ගලයින්ට, පවුල්වලට, කණ්ඩායම්වලට සහ ප්‍රජාවන්ට ඔවුන්ගේ පුද්ගල හා සාමූහික යහපැවැත්ම වැඩිදියුණු කිරීමට උපකාර කිරීම සමබන්ධ වෘත්තියකි. එහි අරමුණ වනන්නේ මිනිසුන්ට ඔවුන්ගේ කුසලතා වර්ධනය කරගැනීමට සහ ඔවුන්ගේ සම්පත් සහ ප්‍රජාවේ ගැටලු විසඳීමට භාවිතා කිරීමේ හැකියාව වර්ධනය කිරීමයි. සමාජ වැඩ කටයුතු පුද්ගලයා හා පෞද්ගලික ගැටලු

කෙරෙහි පමණක් නොව, දුප්පත්කම, විරැකියාව සහ ගෘහස්ථ හිංසනය වැනි පුළුල් සමාජ ගැටලු සමඟ ද සැලකිලිමත් ලෙස සම්බන්ධ වේ"

- කෙනේඩියානු සමාජ සේවකයින්ගේ සංගමය -

"තනි තනිව හෝ සමූහයක් ලෙස පුද්ගලයින්ට සමාජමය හා පෞද්ගලික සංතෘප්තිය හා ස්වාධීනත්වය ලබා ගැනීමෙහිලා උපකාර කරන මානව සබඳතා පිළිබඳව දැනුම හා කුසලතා මත පදනම් වූ වෘත්තීය සේවයකි"

-වෝල්ටර් ෆ්‍රීඩ්ලැන්ඩර් - (Ambrosino & Hefferma, 2012, P.08).

සමාජ සේවකයා පුද්ගලයාගේ ජීවිත ප්‍රතිලාභ වැඩිදියුණු කරගැනීමට උපකාර කරයි. එමගින් අවධානමට ලක් වූ පුද්ගලයන්ට හානි කිරීමට හෝ අපයෝජනයට ලක් වූ පද්ගලයින්ට ස්වාධීනව ජීවත්වීමට උපකාර කිරීම සිදු කරයි. සමාජ සේවකයින් බොහෝවිට සුහසාධන හා සෞඛ්‍ය වෘත්තිකයින් සමඟ වැඩ කරයි. සමාජ වැඩකරුවාගේ මෙහෙවර වන්නේ සියලුදෙනාටම ඔවුන්ගේ පූර්ණ හැකියාවන් වර්ධනය කර ඔවුන්ගේ ජීවිත නගාසිටුවීම හා අක්‍රීය වීම වැළැක්වීමයි.

සමාජ සේවකයින් ඔවුන්ගේ ජීවිතවල ප්‍රතිඵල වැඩිදයුණු කිරීම සඳහා පුද්ගලයින් සහ පවුල් සමඟ කටයුතු කරයි. මෙය අවදනමට ලක්විය හැකි පුද්ගලයින් හානිවලින් හෝ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීමට හෝ මිනිසුන්ට ස්වාධීනව ජීවත්වීමට සහය වීමට උපකාරී වේ. සමාජ සේවකයින් මිනිසුන්ට සහයෝගය දක්වයි. නීතීඥයින් ලෙස ක්‍රියා කරයි. සමාජ සේවකයින් බොහෝවිට සෞඛ්‍ය හා අධ්‍යාපනය වෘත්තිකයින් සමඟ බහු විනය කණ්ඩායම්වල සේවය කරයි.

- බ්‍රිතාන්‍ය සමාජ සේවකයින්ගේ සංගමය -

ඉහත නිර්වචනයන් අනුව පෙනී යන්නනේ සමාජ ප්‍රශ්නයන් කෙරෙහි පිටත සිට විශ්ලේෂණයන් සිදු කරන හා දුරස්ථ මට්ටමකින් ක්‍රියාත්මකවන ආයතනගත ක්‍රියාවලියන්ට සාපේක්ෂව සාමාජ වැඩ වෘත්තිකයාට ප්‍රායෝගික අදාළ ක්ෂේත්‍රය තුළ දී ගැටලුව හඳුනා ගනිමින් සමීපව ක්‍රියා කිරීමේ හැකියාව පවතින බවයි.

**පර්යේෂණ ගැටලුව**

ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන අවම කිරීමෙහිලා සමාජ වැඩකරුගේ සක්‍රීය දායකත්වය ලබාගත හැක්කේ කෙසේද?

**පර්යේෂණ අරමුණු**

**ප්‍රධාන අරමුණ**

ළමා අපයෝජනය අවම කිරීමට සමාජ වැඩකරුගේ දායකත්වය ලබාගත හැකි ආකාරය අධ්‍යයනය කිරීම.

**සුවිශේෂී අරමුණු**

ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනවල වත්මන් තත්ත්වය අධ්‍යයනය කිරීම.

ළමා අපයෝජන වැළැක්වීමෙහිලා ආයතනගත ක්‍රියාවලියන්හි සාර්ථක අසාර්ථකභාවය අධ්‍යයනය කිරීම.

සමාජ වැඩ ක්ෂේත්‍රය තුළ ළමා අපයෝජනය අවම කිරීමට හා වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

**දත්ත රැස් කිරීමේ ශිල්පීය ක්‍රම හා දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය මූලික වශයෙන් ම ද්විතීක දත්ත මත පදනම් වන අතර ශ්‍රී ලංකාවේ පසුගිය වසර පහට අදාළව ළමා අපයෝජන සිදුවීම් සම්බන්ධයෙන් වන සංඛාලේකන දත්ත එක්රැස් කිරීම සඳහා යොදාගනු ලබන අතර ළමා අපයෝජන සම්බන්ධයෙන් පළ වී ඇති පර්යේෂණ වාර්ථාවන්හි අඩංගු ගුණාත්මක තොරතුරු රැස්කොට කරනු ලබන විශ්ලේෂණයක් මෙම පර්යේෂණයෙහි ඇතුළත් වේ.


**දත්ත විශ්ලේෂණය කිරීමේ ක්‍රමවේද**

මෙම පර්යේෂණය මූලිකවම ගුණාත්මක දත්ත මත පදනම් වූ පර්යේෂණයක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන අතර ගුණාත්මක දත්ත තහවුරු කිරීම සඳහා ප්‍රමාණාත්මක දත්ත උපයෝගී කරගනු ලැබේ. ඒ අනුව මෙහි දත්ත විශ්ලේෂණය සඳහා SPSS, Excel යන පරිගණක මෘදුකාංග භාවිත කරනු ලබයි. එහි දී ප්‍රස්ථාර, වගු සටහන් ආශ්‍රයෙන් සංඛ්‍යාත්මක දත්ත විශ්ලේෂණය කරනු ලබයි. ගුණාත්මක දත්ත විශ්ලේෂණය කිරීමේ දී එයට අදාළ සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයන් ඔස්සේ විග්‍රහයට ලක් කරනු ලබයි.

ළමා අපයෝජනය සම්බන්ධයෙන් ලෝකයේ තොරතුරු සැකෙවින් විමසා බැලීමේ දී,ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව කාන්තාවන් පස් දෙනෙකුගෙන් එක් අයෙකු සහ පිරිමින් 13 දෙනෙකුගෙන් එක් අයෙකු ළමා කාලයේ දී ලිංගික අතවරයන්ට ලක් වූ බව වාර්ථා වේ. සෑම වසරකම වයස අවුරුදු 15ට අඩු ළමුන් 41,000ක් මිනීමැරුම්වලින් මිය යන බව ගණන් බලා තිබේ. මානසික සෞඛ්‍ය අපයෝජනය හෘද රෝග, පිළිකා,සියදිවි නසාගැනීම් සහ ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාධන වලට දායක විය හැකිය. යුනිසෙෆ් සංවිධානයට අනුව ටැන්සානියාව, කෙන්යාව,සිම්බාවේ වැනි රටවල ගැහැණු ළමයි තුන්දෙනෙකුගෙන් එක් අයෙකු යම් ආකාරයක ලිංගික අතවරයකට ලක්ව ඇත. එක්සත් ජනපදය වැනි වඩා සංවර්ධිත රටවල නව යොවුන්වියේ දරුවන්ගෙන් 25%ක් සහ පිරිමි ළමයින්ගෙන් 10%ක් පමණ යම් ආකාරයක ලිංගික සිදුවීම්, අපයෝජන, මංකොල්ලකෑම් හෝ පහරදීම්වලට ගොදුරු වී ඇත. වයස අවුරුදු 2ත් 14ත් අතර ලෝකයේ දරුවන් 10 දෙනෙකුගෙන් එක් අයෙකු දිනපතාම ශාරීරික හිංසනයට ලක් වේ. සෑම මිනිත්තු 5කට වරක් දරුවෙක් ප්‍රචණ්ඩත්වයෙන් මිය යයි. වර්තමානයේ බොහෝ රටවල ශාරීරික දඬුවම්

සාමාන්‍ය දෙයක් වන අතර ඕස්ට්‍රේලියාවේ පවුල් 10කින් එකක් තම දරුවන්ට වේවැල්, සැරයටි හෝ පටිවලින් ද දඩුවම් කිරීමට උපදෙස් දෙයි. ලෝකයේ විවාහක බාල වයස්කරුවන්ගේ සංඛ්‍යාව වසරකට මිලියන 14 දක්වා ඉහළ යන අතර එයින් ගම්‍ය වන්නේ ගැහැණු ළමයින් 39,000ක් දිනකට විවාහවන බවයි. සෝමාලියාවේ බාල වයස්කරුවන්ගේන් 45%ක් වයස අවුරුදු 18ට පෙර විවාහ වීමට බල කෙරී ඇති අතර 98%කට වඩා වැඩි ප්‍රමාණයක් ලිංගික විකෘතිතාවයට ලක්ව ඇත. මෙය දැනට පවතින ප්‍රභලම හා කුරිරුම ගැටලුවකි. විනෝදය පිළිබඳ සංවේදනය තුරන් කිරීම සඳහා දේශගුණික විකෘත්ති කිරීම් රටවල් 29ක සිදු කෙරෙන අතර මේ වන විටත් ගැහැනු ළමයි 1400ක් පමණ සිදු කර ඇති අතර එය සෑම වසරකම මිලියන දෙකක් දක්වා ඉහළ යයි (බ්‍රවුන්, 2021).

ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය පිළිබඳ තෙරතුරු ලබා ගැනීමේ දී ශ්‍රී ලංකා ළමා ආරක්ෂණ දෙපාර්තමේනතුව හා ළමා හා කාන්තා කාර්යංශය ප්‍රධාන වේ. ශ්‍රී ලංකා ළමා ආරක්ෂණ දෙපාර්තමේනතුව මඟින් වර්ෂයක් අවසානයේ ළමා අපයෝජන සිදුවීම් වාර්තාකරණය පිළිබඳ දත්ත එළිදක්වනු ලබන අතර එහි විශ්ලේෂණයක්




පහත දැක්වේ. (පර්යේෂිකාව විසින් සම්පාධිතයි)

දිස්ත්‍රික්ක අනුව 2017, 2018, 2019, 2020, 2021 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂණ අධිකාරියට ළමා අපයෝජන සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි.

| දිස්ත්‍රික්කය | සිදුවීම් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **2019** | **2020** | **2021** |
| අම්පාර | 208 | 229 | 201 | 1134 | 230 |
| අනුරාධපුර | 441 | 434 | 487 | 944 | 563 |
| බදුල්ල | 198 | 237 | 224 | 627 | 250 |
| මඩකලපුව | 179 | 189 | 166 | 467 | 180 |
| කොළඹ | 1302 | 1330 | 1167 | 454 | 2175 |
| ගාල්ල | 586 | 617 | 537 | 454 | 642 |
| ගම්පහ | 974 | 1066 | 888 | 404 | 1088 |
| හම්බන්තොට | 310 | 361 | 335 | 368 | 392 |
| යාපනය | 188 | 207 | 175 | 366 | 196 |
| කළුතර | 591 | 540 | 478 | 363 | 658 |
| නුවර | 382 | 420 | 390 | 301 | 461 |
| කෑගල්ල | 286 | 349 | 288 | 254 | 388 |
| කිලිනොච්චිය | 121 | 104 | 141 | 243 | 155 |
| කුරුණෑගල | 681 | 823 | 726 | 226 | 789 |
| මන්නාරම | 69 | 69 | 80 | 223 | 89 |
| මාතලේ | 200 | 210 | 140 | 192 | 240 |
| මාතර | 316 | 346 | 301 | 174 | 416 |
| මොණරාගල | 226 | 224 | 221 | 160 | 285 |
| මුලතිව් | 132 | 98 | 122 | 159 | 133 |
| නුවරඑළිය | 184 | 168 | 177 | 136 | 199 |
| පොළොන්නරුව | 245 | 246 | 229 | 120 | 268 |
| පුත්තලම | 403 | 440 | 375 | 119 | 463 |
| රත්නපුර | 518 | 537 | 471 | 118 | 693 |
| ත්‍රිකුණාමලය | 138 | 137 | 133 | 92 | 173 |
| වව්නියාව | 131 | 131 | 106 | 67 | 119 |
| එකතුව | 9014 | 9512 | 8558 | 8165 | 11187 |

ඉහතින් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ළමා අපයෝජන සම්බන්ධයෙන් පසුගිය වසර පහ තුළ එනම් 2017, 2018, 2019, 2020, 2021 යන වර්ෂයන්ට අදාළව ලැබී ඇති පැමිණිලි වේ. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කවලට අදාළව එක් එක් වර්ෂය තුළ දී ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාවන් මෙහි දැක්වෙන අතර කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල අනෙකුත් දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂව වැඩි ළමා අපයෝජන පැමිණිලි සංඛ්‍යාවක් වාර්තා වී ඇත. මන්නාරම, මුලතිව්, වව්නියාව,


කිලිනොච්චිය ආදී දිස්ත්‍රික්කවලින් අඩු ළමා අපයෝජන වාර්තාවීමක් දක්නට ලැබේ. මුල් වසර තුන තුළ එනම්, 2017, 2018, 2019 යන වර්ෂ තුළ සෑම දිස්ත්‍රික්කයකම පාහේ ළමා අපයෝජන සම්බන්ධයෙන් යම්කිසි වැඩිවීමක් දක්නට ලැබුණ ද 2020 වර්ෂයේ එය සැලකිය යුතු මට්ටමකින් පහත බැස ඇති නමුත් නැවතත් 2021 වර්ෂයේදී එහි සීග්‍ර වර්ධනයක් පෙන්වනු ලබයි.

මෙහි දැක්වෙන්නේ ළමා අපයෝජන සිදුවීම් වාර්තාගත වූ ප්‍රමාණය වන අතර වාර්තා නොවූ ළමා අපයෝජන සිදුවීම් ඇතැම්විට වාර්තා වූ ප්‍රමාණයන් ද ඉක්මවා යුන ඇත. ප්‍රධාන වශයෙන් ම ළමා අපයෝජනයට එරෙහි සංවිධානවල ක්‍රියාකාරීත්වය මෙහෙයවනු ලබන බස්නාහිර පළාත තුළ අනෙකුත් ප්‍රදේශයන්ට සාපේක්ෂව එම පහසුකම් වර්ධනය වී ඇති පරිසරයක වුව ද ළමා අපයෝජනය මෙතරම් ඉහළ අගයක් ගනු ලබන්නේ ශ්‍රී ලංකාව තුළ ආයතනගත ක්‍රියාවලියේ පවතින යම් ගැටලුකාරී තත්තවයක් හේතුවෙනි.

අපයෝජනයේ ස්වරූපය අනුව 2017, 2018, 2019, 2020, 2021 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂණ අධිකාරියට ළමා අපයෝජන සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි.

| Type of abuse | No of complaints | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| 286A. Obscence Publication / අසභ්‍ය ප්‍රකාශන | 08 | 15 | 23 | 39 | 10 |
| 288. Procuring to bes/ සිගමනෙහි යෙදවීම | 312 | 315 | 299 | 200 | 240 |
| 360B Sexual Exploitation of children / ළමා ලිංගික සූරාකෑම | | 04 | 04 | | 08 |
| 288B. Trafficking Restricted Articles / තහනම් භාණ්ඩ ජාවාරමෙහි යෙදවීම් | 28 | 40 | 29 | 44 | 44 |
| 308A. Cruelty to Children /දරුවන්ට එරෙහි කෲරත්වය | 2144 | 2413 | 2342 | 2237 | 2741 |
| 345. Sexual Harassment / ලිංගික හිංසනය | 501 | 555 | 594 | 518 | 947 |
| 352. Kidnapping from lawful guardianship / නීත්‍යානුකූල භාරකාරත්වයෙන් පැහැර ගැනීම | 145 | 120 | 109 | 97 | 99 |
| 353. Abduction / පැහැරගැනීම | 42 | 45 | 44 | 71 | 354 |
| 360C. Trafficking / ජාවාරම | 116 | 125 | 119 | 82 | 124 |
| 363. Rape / දූෂණය | 340 | 311 | 294 | 256 | 123 |
| 364A. Incest / අනියම් සබඳතා | 01 | 01 | 01 | 02 | 08 |
| 365B. Grave sexual abuse / බරපතල ලිංගික අපයෝජන | 309 | 735 | 288 | 373 | 246 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 71. CYPO - Neglect of Children / දරුවන් නොසලකා හැරීම | 390 | 536 | 906 | 466 | 1535 |
| Child Labor / ළමා ශ්‍රමිකයින් ලෙස යෙදවීම | 269 | 262 | 265 | 228 | 375 |
| Compulsory Education / අනිවාර්ය අධ්‍යාපනය | 1324 | 1267 | 1290 | 643 | 541 |
| Domestic Violence / ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය | 80 | 104 | 79 | 50 | 97 |
| Juvenile Delinquency / බාල අපරාධ | 492 | 374 | 337 | 270 | 263 |
| MISC. / Miscellaneous / විවිධ | 2493 | 2622 | 1505 | 2580 | 3432 |
| Unnatural Offence / අස්වාභාවික වැරදි | 01 | 01 | 01 | 02 | |
| Soliciting a child / දරුවෙකු ඉල්ලා සිටීම | 10 | 15 | 14 | 07 | |
| 76. CYOP – Sale of tobacco / දුම්කොළ විකිණීම | 03 | | 01 | | |
| 365.A. Gross Indecency / අවිනීතකම | 05 | 07 | 01 | | |
| 35. CYPO – Child or young person in need of C&P /අවශ්‍යතා ඇති තරුණයින් හෝ දරුවන් | | | 07 | | |
| 308. Exposure and Abandonment / නිරාවරණය සහ අතහැරීම | | 03 | 02 | | |
| 27A. ACO – Unlawful custody /නීති විරෝධී රඳවාගැනීම | | 02 | 04 | | |
| 14. ACO – Restriction on payment / ගෙවීම් සීමා කිරීම | 01 | | 01 | | |
| Total | 9014 | 9512 | 8559 | 8165 | 11187 |




ළමා අපයෝජන සිදුවන ආකාරය අනුව පසුගිය වසර පහ තුළ ජාතික ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබුණු පැමිණිලි මෙහිදී පෙන්වා දිය හැකිය. එහි දී දරුවන්ට එරෙහි කෲරත්වය අනිවාර්ය අධ්‍යාපනය ලබා නොදීම සම්බන්ධ ගැටලු හා වෙනත් විවිධාකාරයේ අපයෝජනයන් වර්ථාවීමේ වැඩිවීමක් ඉහත දත්ත අනුව පෙන්වා දිය හැකිය.

දරුවන්ට එරෙහි කෲරත්වය සම්බන්ධයෙන් දණ්ඩනීති සංග්‍රහයේ 308 වගන්තියේ සඳහන් ළමුන් කෲරත්වයට පත්කිරීම පිළිබඳ වරද තවත් උප වගන්ති කීපයක් යටතේ සම්පාදනය කිරීමට අවධානය යොමු වී ඇති බව ජාතික ළමා රක්ෂක අධිකාරියේ සභාපතිවරයා පවසා තිබේ(http://bbc.com).

දරුවන්ට එරෙහි බරපතල ලිංගික අපයෝජන සැලකිය යුතු මට්ටමකින් පහළ බැසීමක් සිදු වී නොමැති අතර ළමයින්ට එරෙහි ලිංගික හිරිහැර 2021 වර්ෂය අවසානය වන විට සලකා බැලි යුතු ප්‍රමාණයකින් වැඩි වීමක් සිදු වී ඇත. දරුවන් නොසලකාහැරීම සම්බන්ධ පැමිණිලි 1535 ක් 2020 වාර්ථා වී ඇති අතර ළමා අපයෝජනය සම්බන්ධයෙන් ළමයින්ගේ මානසික අපයෝජනය වැඩි වශයෙන් සිදුවන අංශයක් ලෙස මෙය පෙන්වා දිය හැකිය.

2017 වර්ෂය අවසානය වන විට නීතිපති දෙපාර්තමේන්තුවේ වසර දහයකට වඩා කල්ගත වූ ළමා අපයෝජන සිද්ධීන් 17 00 කට වැඩි ප්‍රමාණයක් ගොඩගැසී තිබේ. මෙම අගය 2018 අවසන් වන විට 20 000 ඉක්මවා ඇති බව දක්වා තිබේ.

2018 ජනවාරි මස ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් කෙරුණු ඒකාබද්ධ පස්වන හා හයවන වාර්ථා පිළිබඳ එක්සත් ජාතීන්ගේ ළමා ආරක්ෂණ කමිටුවේ අවසන් නිරීක්ෂණ මගින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ අලස ප්‍රතිපත්තිය බරපතල අවධානයට යොමු කෙරුණේ රතු නිවේදනයක් ද නිකුත් කරමින් බව "ළමා හිංසනයට තිත පදනම" පෙන්වා දෙනු ලැබීය(https://lankaviews.com).

## ළමා අපයෝජනය සිදුවීම හේතුවෙන් දරුවන්ට සිදුවන බලපෑම

ළමා අපයෝජනය නිසා ඇතිවිය හැකි ක්ෂණික ශාරිරික ප්‍රති විපාකවලට අමතරව දරුවන්ට චිත්තවේගීය, චර්යාත්මක හා සමාජ අබාධ ඇති කරයි. වයස අවුරුදු තුනකට අඩු කුඩා දරුවන් තුළ අපයෝජනය සිදු වූ විට බැඳීම වර්ධනය නොවීමට ඉඩ ඇති අතර එම නිසා ඔවුන්ගේ සමාජ කුසලතා සහ ආත්ම අභිමානයට හානි සිදු වනු ඇත. මෙම අවස්ථාවලදී දරුවාට නපුරු සිහින, නින්දේ ආබාධ, ආහාර පුරුදුවල වෙනස්වීම් ඔවුන්ගේ මනෝ චිකිත්සක සංවර්ධනය ප්‍රමාද වීම හෝ වැසිකිළි පුහුණුව අහිමි වීම සාමාන්‍ය දෙයකි.

වැඩෙනවිට අතවරයට ලක් වූ දරුවන්ට ඔවුන්ගේ හැඟීම් සහ ආවේගයන් තේරුම් ගැනීමට ශ්‍රේණිගත කිරීමට හා නියාමනය කිරීමට අපහසු විය හැකිය. ඔවුන්ට බොහෝ විට තමන් ගැන සහ අවට ලෝකය ගැන ධනාත්මක විශ්වාසයන් නොමැත. පොදුවේ ගත්කළ අන්‍යයන්ගේ අපහසුතාවයන් හඳුනාගැනීමට හෝ ඒවාට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට අඩු හැකියාවක් ඇත. ඔවුන් තම සම වයසේ මිතුරන්ගේ හෝ ගුරුවරුන්ගේ අභිප්‍රායන් ඇත්ත වශයෙන් ම වඩා සතුරු යැයි අර්ථ නිරූපණය කිරීමට නැඹුරු වෙති. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ඔවුන් විඳින් අඛණ්ඩ චිත්තවේගීය ප්‍රතිවරෝධතාය. මන් ද ඔවින් රැකබලාගත යුතු යැයි සිතන සහ ඔවුන් ආදරය කරන පුද්ගලයෙකු ඇත්ත වශයෙන් ම ඔවුන්ට හිරිහැර කරන බැවිණි.

වැඩිහිටි දරුවන්ගේ නව යොවුන්වියේ අපයෝජනය සිදුවනවිට ඔවුන් නිවසින් පැන යාමට,තමන්ට පහරදීමට හා සාමාන්‍යයෙන් අධ්‍යයන කාර්ය සාධනය අඩු කිරීමට පෙළඹේ. සමාජ හුදෙකලාව, බාල වයස්කරුවන් මත්ද්‍රව්‍ය අනිසි භාවිතය, තමන්ගේ ශරීරය ප්‍රතික්ෂේප කිරීම, සාමාන්‍ය බිය හෝ ලැජ්ජාව හෝ වරදකාරී හැඟීම හෝ මානසික අවපීඩනය හෝ අනන්‍යතා ආබාධ වැනි රෝගාබාධ පොදු වේ. මානසික අබාධවලින් ඔබ්බට එක්සත් ජනපදයේ කරන ලද පර්යේෂණයකින් හෙළි වී ඇත්තේ ශාරීරික දඬුවම් මගින් මොලයේ වෙනස්කම් සිදුවිය හැකි බවයි. මේ ආකාරයට කුඩා කාලයේ සිට අවුරුදු 5ට වැඩි ළමයින්ට පහරදීම් හෝ ශාරීරික හිංසනයන්ට ලක්වන ළමයින්ට මෙම වර්ගයේ ප්‍රචණ්ඩත්වයට ගොදුරු නොවන දරුවන් හා සසඳනවිට අඩු IQ ප්‍රමාණයක් තිබිය හැකිය.

**සමාජ සේවකයාට ළමා අපයෝජනය වැළැක්වීම සම්බන්ධයෙන් දායක විය හැකි ආකාරයන්**

ප්‍රජා අධ්‍යාපන සම්බන්ධීකාරක වැනි භූමිකාවන් හරහා, සමාජ සේවකයන්ට ඔවුන්ගේ සංවේදනය සහ සංස්කෘතික සංවේදිතාව යොදා ගනිමින් මෙම දරුවන්ට තමන් තනිවම නොවන බවත්, අපයෝජනය ඔවුන්ගේ වරදක් නොවන බවත් තේරුම් ගැනීමට උපකාර කළ හැකිය. සමාජ සේවකයින්ට ධනාත්මක වැඩිහිටි ආදර්ශයක් ලෙසද ක්‍රියා කළ හැකිය - ඔවුන්ගේ ජීවිතයේ ස්ථාවර වැඩිහිටියන් සමග සැලකිලිමත් සබඳතා පැවතීම දරුවන්ට නිවසේදී දැනෙන ආතතිය දුරු කිරීමට උපකාරී වේ.

පාසල් වැඩසටහන් සහ ප්‍රජා මධ්‍යස්ථාන මගින් මෙන් ම ආරක්ෂිත අවකාශයන් හා සමාජගත කිරීම සඳහා වයසේ මිතුරන්ගෙන් සහාය ලබා දිය හැකිය. අපයෝජනයට ලක්වන දරුවන්ට, විශේෂයෙන් හුදකලා වීමේ හැඟීම් උග්‍ර වූ අයට කනස්සල්ල අඩු කිරීමට මෙය උපකාරී වේ. මෙම වර්ගයේ වැඩසටහන් වල වැඩ කිරීම, සමාජ සේවකයින්ට ඔවුන්ට අවශ්‍යය විශේෂ අවධානය යොමු කරමින් ඔවුන් සැපපහසු වන සමාජ ක්‍රියාවලීන් සඳහා පහසුකම් සැලසිය හැකිය.

පුද්ගලික පරිචය හරහා උපදේශන ලබා දීමට බලපත්‍රලාභී සමාජ සේවකයින්ට හැකියාව ඇත, මෙම දරුවන් තනිව නොසිටින බවත් ඔවුන් අත්විඳින ලද කිසිවක් ඔවුන්ගේ වරදක් නොවන බවත් අවධාරණය කිරීම වැදගත් වනු ඇත. බොහෝ විට අපයෝජනයට ලක්වන දරුවන් තමන් ලක් වූ දෙය වැරදි බවත්, සුදුසු සෙනෙහසක් පෙන්වීමක් නොවන බවත් තේරුම් නොගනිති.

සමාජ සේවකයින් පවුලක අක්‍රියතාව තක්සේරු කිරීමේදී පාරිසරික සාධක සැලකිල්ලට ගනිමින් සංකීර්ණ තත්වයන්ට සංස්කෘතික නිපුණතාවය ගෙන එයි. පුද්ගලයන් වශයෙන්, පවුලක් ලෙස සහ ඔවුන්ගේ ප්‍රජාවේ කොටසක් ලෙස ඔවුන් මුහුණ දෙන අභියෝග හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමට උපකාර කරමින් මුළු පවුල සමගම වැඩ කිරීම කෙතරම් වැදගත් දැයි ඔවුහු දනිති. වැඩිහිටි හැසිරීම් අලුත්වැඩියා කිරීමට සහ දරුවන්ට අපයෝජනය තේරුම් ගැනීමට, එයට මුහුණ දීමට සහ ආත්ම අභිමානය නැවත ලබා ගැනීමට මෙම සංවේදීතාව අත්‍යවශ්‍ය වේ.

**සමාලෝචනය**

ඉහත දත්තයන් විශ්ලේෂණය කර පිරික්සීමේ දී ළමා අපයෝජනය යනු ශ්‍රී ලංකාව තුළ කෙතරම් ළමා ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක වුව ද කිසිඳු ප්‍රගතියක් වාර්තාකර නොමැති සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනාගැනීමට හැකිය. 2021 වර්ෂය අවසන් වන විට ළමා අපයෝජනය සම්බන්ධ සිදුවීම් වාර්තාවීම් ඉහළ අගයක් ගනු ලබයි. එසේ වීමට රටතුළ පැවති අර්බුධකාරී වටපිටාව යම් දායකත්වයක් ලබා දුන්න ද ගැටලුවෙහි සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබීම සලකා බැලිය යුතු තත්ත්වයකි. මන් ද ශ්‍රී ලංකාව තුළ ළමයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් ජාතික හා ජාත්‍යයන්තර විධිවිධාන රැසක් ක්‍රියාත්මක වුව ද එහි සැබෑ අරමුණු කොයිබට ද? යන ගැටලුව පැන නගී. ළමයින් යනු සංවේදී මනුෂ්‍ය කණ්ඩායමක් වන අතර යාන්ත්‍රික ක්‍රියාකාරීත්වයට

සාපේක්ෂව ඔවුන් හා ප්‍රායෝගික මට්ටමින් සම්බන්ධ වී සමීපව කටයුතු කිරීම සුදුසු වේ. මේ තුළින් අපයෝජනයට ලක් වූ දරුවන් සමාජගත කිරීමේ ක්‍රියාවලිය පහසු වනවා මෙන් ම, දරුවන්ගේ ආරක්ෂාකාරී වටපිටාව සම්බන්ධයෙන් දරුවන්ට මෙන් ම දෙමාපියන්ට ද සමීප අවබෝධයක් ළබා දීමට කටයුතු කළ හැකිය. එපමණක් නොව ළමා අපයෝජනයෙහි වරදකරුවන් වන ළමා අපයෝජකයින්ගේ චර්යා රටාවන් සමීපව හඳුනාගනිමින් ඔවුන්ව පුනරුත්තාපනය කිරීම හා ළමා අපයෝජනයට නිසි හේතු හඳුනාගනිමින් ඒවා වැළැක්වීමට කටයුතු සම්පාදනය කළ හැකිය. මෙම ක්‍රියාවලීන් සම්පූර්ණයෙන් ම සමීප ප්‍රායෝගික ක්‍රියාවලීන් විය යුතු අතර ගැටලුව සඳහා ප්‍රායෝගිකම වෘත්තිය ලෙස සමාජ වැඩ වෘත්තිය පෙන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාව තුළ වෘත්තීය සමාජ වැඩකරුවන් නියමිත ආයතනගත ක්‍රියාවලියකට යොමුකර නොමැතිකම හේතුවෙන් ඔවුන්ගේ වෘත්තියට වටිනාකමක් හෝ නියමිත වෘත්තීය රටාවක් ගොඩනගාගැනීමට අපහසු වී ඇත. මේ තත්ත්වය නිරාකරණය කරගනිමින් සමාජවැඩ වෘත්තිකයින් සමාජයට වෘත්තීය මට්ටමින් හඳුන්වාදීමේ හැකියාවක් පවතින්නේ නම් හා සමාජ සේවකයාට නිශ්චිත වූ කාර්යභාර්යමාලාවක් පවත්වාගෙන යාමට සමාජපසුබිම නිර්මාණය කරගැනීමට හැකි වන්නේ නම් සමාජය තුළ සිදුවන වාර්තා නොවන ළමා අපයෝජන සිදුවීම් ද වාර්තා කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. මන් ද සමාජ සේවකයා නැතිනම් සමාජ වැඩ වෘත්තිකයා පුද්ගලයාට ඉතා සමීපව කටයුතු කරන අයෙකු වන බැවිණි. එමෙන් ම සමාජ වැඩ වෘත්තිකයා සමාජ වැඩ උපාධිධාරියෙක් විය යුතු අතර ඒ ඒ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ නීතිමය දැනුම හා පුහුණුව ලත් අයෙකුවිය යුතුය. එවිට ගැටලුව හඳුනාගැනීම, එහි ක්‍රියාත්මක විය යුතු පිළිවෙළ කඩිනමින් තීරණය කළ හැකි වීම මෙන් ම නිවැරදි ගැටලු විසඳීමේ ක්‍රියාවලීන් අනුගමනය කළ හැකි වීම යන වෘත්තීය ගුණාංගවලින් සමන්විත අයෙකු වනු ඇත. විශේෂයෙන් ම ළමා අපයෝජනය සම්බන්ධයෙන් ක්‍රියාකරන වෘත්තීය සමාජ සේවකයෙකු විශ්වාසදායී වෘත්තීය ආචාරධර්ම පද්ධතියකින් හෙබි අයෙකු විය යුතු අතර සමාජ ප්‍රශ්න විසඳීමෙහිලා යොදවන සමාජ සේවා වෘත්තිකයින්ට ඔවුන්ගේ පුහුණු කාලය තුළ මේ සම්බන්ධ දැනුම හා ආකාල්ප වර්ධනය සිදුකළ යුතුය. ළමා අපයෝජනය සමබන්ධයෙන් වන වෘත්තීය සමාජ වැඩකරුවෙකු ප්‍රාදේශීය මට්ටමින් හෝ අනියුක්ත කිරීමට පියවර ගන්නේ නම් ළමා අපයෝජනය අවම කිරීමට එය හේතුවක් වනු ඇත. මන් ද සමීප මැදිහත්වීම් හා දැනුවත් කිරීම් තුළ විශ්වාසනීයත්වය ආරක්ෂා වීම මෙන් ම ගැටලුවට කඩිනමින් විසඳුම් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. එක්සත් ජනපද සෞඛ්‍ය හා මානව සේවා දෙපාර්තමේන්තුවට අනුව, වාර්ෂිකව ළමා ආරක්ෂණ සේවා වෙත යොමු කරන මිලියන 6.6 ළමුන්ගෙන්, විමර්ශන වාර්තාවක් ලැබෙන්නේ මිලියන 3.2 කට පමණක් වන අතර මෙම ප්‍රතිචාර නොමැතිකම පෙන්නුම් කරන්නේ සමාජ සේවකයින් ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය කෙතරම් විශාලද යන්නයි. ශ්‍රී ලංකාව තුළ ද ළමා අපයෝජනය සම්බන්ධයෙන් සමාජ වැඩ හරහා සමාජ සේවාව වෘත්තීය මට්ටමමෙන් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරනු ලබන්නේ නම් මෙම සමාජ ගැටලුව අවම කරගැනීමට හා වැලැක්වීමට පියවර තැබිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරසේකර, ඩී. (2005). *ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න.* ආරිය ප්‍රකාශකයෝ.

අමරසේකර, ඩී. (2005). *ශ්‍රී ලංකා සමාජයː සමාජවිද්‍යාත්මක විමසුමක්.* ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.

කරුණාරත්න, ආර්. ඒ. ආර්. (2020). *ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්.* කර්තෘ ප්‍රකාශන.

ගම්ලත්, එස්. සහ රණවීර, ආර්. එම්. අයි. සී. (2018). සමාජ වැඩ මැදිහත්වීම් ක්‍රියාවේදී අදාළ කරගත හැකි සමාජ විද්‍යාත්මක දයකත්වය අර්වින් ගොෆ්මාන්ගේ අදහස් ඇසුරින් කරන විග්‍රහයක්. *ප්‍රතිමාන*, 12, 39-50. Retrieved From: https://hss.ruh.ac.lk/images/Sociology/Prathimana_12th_Volume.pdf[Accessed 26 November 2022].

ජයකොඩි, ජේ. ඒ. එන්. ඒ. (2015). *ළමා අපයෝජනයේ ස්වභාවය පිළිබඳ විමසුමක්.* කැළණිය විශ්වවිද්‍යාලය.

පෙරේරා, එස්. (2011). *සමාජ ප්‍රශ්න.* කර්තෘ ප්‍රකාශන.

බ්‍රවුන්, සී. (2021). *ළමා අපයෝජනයː වර්ග, හේතු සහ ප්‍රතිවිපාක.*

Retrived from:https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://si.warbletoncouncil.org/maltrato-infantil-13770&ved=2ahUKEwjszueog-T7AhVYVWwGHXTuBmgQFnoECCAQAQ&usg=AOvVaw2yFLvkZjqnuEmhn2gu6KVG

ළමා අපයෝජනය පිළිබඳ අත්පොත, (1995) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

ළමා අපයෝජන පැමිණිලි වාර්තාව, (2017). ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය.

ළමා අපයෝජන පැමිණිලි වාර්තාව, (2018). ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය.

ළමා අපයෝජන පැමිණිලි වාර්තාව, (2019). ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය.

ළමා අපයෝජන පැමිණිලි වාර්තාව, (2020). ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය.

ළමා අපයෝජන පැමිණිලි වාර්තාව, (2021). ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය.

Ambrosino, R., Hefferma, T. & Shuttlesmuth, G. (2012). *Social work and Social welfare*, Canada; Brooks/Cole.

Jacobi, G., Dettmeyer, R., Silbylle, B., Brosing, B., & Heramann, B. (2010) Child Abuse and Neglect: Diagnosis and Management. *Deutsches Arzteblatt International.* 107(13).

www.bbc.com/sinhala/topics/cpzd4zgg1y4t